සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**

ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
ஆரம்ப கைத்தொழில் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
MINISTRY OF PRIMARY INDUSTRIES AND SOCIAL EMPOWERMENT


මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/01/චක්‍රලේඛ

ඔබේ අංකය / உமது இல / Your No: ……………………………………

දිනය / திகதி / Date: 2019.05.02

**සමෘද්ධි ප්‍රජාමුල බැංකු චක්‍රලේඛ අංක :- 2019 / 05**

**සියළුම සමෘද්ධි බැංකු/ බැංකු සමිති කළමනාකරුවන් වෙත,**

**<u>සමෘද්ධි බැංකු / බැංකු සමිති සඳහා වත්කම් අත්පත් කර ගැනීම හා විවිධ වූ වියදම් දැරීම් බලතල සීමාවන් සංශෝධනය කිරීම</u>**

01 සමෘද්ධි බැංකු/ බැංකු සමිති අරමුදල් මඟින්, වත්කම් අත්පත් කර ගැනීම, වත්කම් අළුත්වැඩියා කිරීම ඇතුළු අනෙකුත් වියදම් දැරීම් බලතල සංශෝධනය කිරීමට බැංකු කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

02 ඒ අනුව පහත පරිදි වත්කම් අත්පත් කර ගැනීම් හා වියදම් දැරීම් සිදු කිරීමට බලය ඇත.

| අනු අංකය | විස්තරය | අනුමත මුදල් සීමාව රු. | කාලය | වියදම් දැරීමට අනුමැතිය |
|---|---|---|---|---|
| 1 | කාර්යාල උපකරණ ඇතුළු වත්කම් අත්පත් කර ගැනීම. | 50,000 | මාස 2 කට වරක් | පාලක මණ්ඩල/ විධායක කමිටුව |
| 2 | සුළු වියදම් සීමාව | | | |
| I | බැංකු/ බැංකු සමිති කළමනාකරු | 5,000 | මාසයක් තුල | පාලක මණ්ඩල/ විධායක කමිටු ආවරණ අනුමැතියට යටත්ව |
| II | පාලක මණ්ඩල / විධායක කමිටු | 10,000 | මාසයක් තුල | පාලක මණ්ඩල/ විධායක කමිටුව |
| 3 | කම්කරු කුලී / පිරිසිදු කිරීම් සඳහා දෛනික කුලී | 400 | දිනකට | පාලක මණ්ඩල/ විධායක කමිටු ආවරණ අනුමැතිය |
| 4 | ප්‍රචාරණ/ අනුග්‍රාහක වියදම් (සමරු කලාප/ ප්‍රචාරණ කටයුතු) | 5,000 | වසරක් තුල | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය |
| 5 | ගොඩනැගිලි/ උපකරණ/ කාර්යාල උපකරණ නඩත්තු හා උපාංග සවි කිරීම. | 25,000 | මාසයක් තුල | බැංකු පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය |
| 6 | ප්‍රගති සමාලෝචන රැස්වීම් වියදම් | | | |
| I | සමෘද්ධි බැංකු | 10,000 | මාස 02 කට වරක් | පාලක මණ්ඩල ආවරණ අනුමැතිය |
| II | බැංකු සමිතිය | 15,000 | මාස 03 කට වරක් | විධායක කමිටුව ආවරණ අනුමැතිය |


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramul

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் (நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මුල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 28877 |

03 2019 අප්‍රේල් මස සිට බැංකු කළමනාකරුවන්ගේ අතට පාඩු දීමනාව රු. 200/- (පැයකට) දක්වා වැඩි කර ඇත.

04 ගොඩනැගිලි උපකරණ, කාර්යාල උපකරණ නඩත්තුව හා අමතර උපාංග සඳහා වියදම් දැරීම පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතියට යටත්ව සිදු කළ යුතු අතර, නමුත් හදිසි හෝ අත්‍යාවශ්‍ය අවස්ථාවක ආවරණ අනුමැතියට යටත්ව වියදම් දැරීමට ඉඩදෙනු ලැබේ.

05 උපකරණ ඇතුළු වත්කම් මිලදී ගැනීම ප්‍රසම්පාදන කමිටු තීරණ මත සිදුවිය යුතු අතර, වාර්ෂික වත්කම් ආගණනයේදී ඉවත් කරන දෑ වෙනුවෙන් නව මිලදී ගැනීම් සිදු කළ යුතුය. එනමුත් අත්‍යාවශ්‍යය අවස්ථාවක පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය සහිත, මෙහෙයුම් කටයුතුවලට අදාල උපකරණ මිලදී ගැනීමට ඉඩදෙනු ලැබේ.

06 සුළු වියදම් ඇතුළු අනෙකුත් වියදම් දැරීමේදී ඉහත ඡේද අංක 02 අනුව, පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය මත ගෙවීම් කිරිමේ බලය බැංකු/ බැංකු සමිති කළමනාකරුට පමණක් හිමි වන අතර, කිසිදු විටක කළමනාකරුගේ අනුමැතිය නොමැතිව වියදම් දැරීමට බැංකු කාර්ය මණ්ඩලයට නොහැකි බව ද අවධාරණය කරමු.

07 උපයෝගිතා කටයුතු ඇතුලත්ව අනිකුත් වියදම් දැරීම් දැනට දී ඇති උපදෙස් පරිදි බව තවදුරටත් දන්වා සිටිමු.

එස්.ඊ.ආර්.ටී.එම්.එස්.පී. බණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්

<u>පිටපත් :-</u>

01. ලේකම්, ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම්අමාත්‍යාංශය. - කා.දැ.පි.
02. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, - කා.දැ.පි.
03. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.පි.
04. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.පි.
05. සියලුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, - කා.දැ.පි. හා අ.ක.ස
06. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, - කා.දැ.පි. හා අ.ක.ස
07. සියලුම විධායක කමිටු සභාපතිවරුන්, සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිය. - කා.දැ.පි.
08. සියලුම පාලක මණ්ඩල සභාපතිවරුන්, සමෘද්ධි ප්‍රජාමූල බැංකුව. - කා.දැ.පි.